# MANAGEMENT

# කළමනාකරණය

කළමනාකරණය යනු ව්‍යාපාර අරමුණක් සඵලදායී ව ඉටු කර ගැනීම සඳහා පවතින සම්පත් කාර්යක්ෂම ව යොදා ගනිමින් එම ව්‍යාපාරය සැලසුම් කිරීමට, සංවිධානය කිරීමට, මෙහෙයවීමට සහ පාලනය කිරීමට අදාළ වූ ක්‍රියාවලියකි.

මෙහිදී ව්‍යාපාර අරමුණු අපේක්ෂිත අයුරින් ඉටු කර ගැනීම සඵලදායකත්වය යි.

අවම සම්පත් ප්‍රමාණයකින් උපරිම ප්‍රයෝජන ලැබෙන පරිදි සම්පත් භාවිත කිරීම කාර්යක්ෂමතාව යි.

# කළමනාකරණ කාර්යයන්

කළමනාකරණ ක්‍රියාවලිය තුළ ප්‍රධාන කළමනාකරණ කාර්යයන් 04 කි.

01. සැලසුම්කරණය
02. සංවිධානකරණය
03. මෙහෙයවීම
04. පාලනය

ClassWork.LK

## සැලසුම්කරණය

ව්‍යාපාරයක අරමුණු තීරණය කිරීම සහ අරමුණු ඉටුකර ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග තීරණය කිරීම සම්බන්ධ ක්‍රියාවලිය සැලසුම්කරණයයි.

උදා : අවශ්‍ය සම්පත් හා සේවකයන් තීරණය කිරීම.

අවශ්‍ය සම්පත් ලබා ගන්නා ආකාරය තීරණය කිරීම

## සංවිධානකරණය

ව්‍යාපාරයක අරමුණු මුදුන් පමුණුවා ගැනීමට සැලසුම් කරන ලද ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සම්පත්, තනතුරු හා වැඩ බෙදහැරීම සම්බන්ධ ක්‍රියාවලිය සංවිධානකරණයයි.

උදා : ව්‍යාපාරයේ ඉදි කිරීමේ හා අලෙවි කටයුතු සඳහා කළමනාකරුවන් පත් කිරීම.

එක් එක් අංශයට අවශ්‍ය සම්පත් හා සේවකයන් ලබා දීම.

ClassWork.LK

## <u>මෙහෙයවීම</u>

සැලසුම් කරන ලද ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ දී ව්‍යාපාරයේ මානව සම්පත් නිසිලෙස හැසිරවීමේ ක්‍රියාවලිය මෙහෙයවීමයි.

උදා : නිෂ්පාදන කළමනාකරු හා අලෙවි කළමනාකරු තම සේවකයන්ට අවශ්‍ය තොරතුරු සහ උපදෙස් සැපයීම.

## <u>පාලනය</u>

ව්‍යාපාරයේ කටයුතු සැලසුම් කළ ආකාරයෙන් ම සිදු වේ දැයි සොයා බැලීම හා එසේ නොවන්නේ නම් අඩුපාඩු හඳුනාගෙන ඒවා නිවැරදි කිරීම සම්බන්ධ ක්‍රියාවලිය පාලනයයි.

උදා : සැලසුම් කළ පරිදි ගුණාත්වයෙන් යුතු භාණ්ඩ ඉදිකර ඇති දැයි සොයා බැලීම.

සැලසුම් කළ පරිදි කටයුතු සිදු නොවී නම් එයට හේතු සොයා බැලීම.

ClassWork.LK

ClassWork.LK